# පාරිසරික වශයෙන් ධරණීය සංවර්ධනයක් සඳහා නව ප්‍රවේශයක්


**මල්ලිකා කරුණාරත්න,**
*නියෝජ්‍ය අධ්‍යක්ෂිකා,*
*ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව*


මිනිස් අවශ්‍යතා සහ අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීම සංවර්ධනයේ එක් ප්‍රධාන පරමාර්ථයකි. සංවර්ධනය වන රටවල වසන ජනතාවගෙන් විශාල කොටසකගේ මූලික අවශ්‍යතා - එනම්, ආහාර, නිවාස, ඇඳුම් සහ රැකියා යන මේවා සතුටුදායක මට්ටමකින් සම්පූර්ණ වන බවක් නොපෙනේ. මෙකී මූලික අවශ්‍යතා හැරුණු විට, ජනතාවට දියුණු ජීවන තත්ත්වයක් ඇති කර ගැනීම සඳහා නිත්‍යානුකූල අයිතියක් මෙන්ම අභිලාෂයක් ද ඇතිවීමට පුළුවන. ජනතාවගේ වුවමනාවන් හා අභිලාෂයන් සපුරා ගැනීමේ හැකියාව කරුණු දෙකක් මත රඳා පවතිනු පෙනේ. එනම්, ජාතික ආර්ථික වර්ධනය යෝග්‍ය මට්ටමක් කරා පැමිණවීම සහ වරප්‍රසාද අහිමි වූ ජන කොටස් වලට ප්‍රමාණවත් අවස්ථා ලැබීම සහතික කෙරෙන උචිත බෙදාහැරීමේ ප්‍රතිපත්ති යොදා ගැනීමත් යන මේවා ය.

ආර්ථික වර්ධනය හා සංවර්ධනය යන ක්‍රියාවලීන් සමඟ භෞතික පරිසර පද්ධතීන් පැහැදිලි වෙනස්කම් වලට භාජනය වේ. ස්වාභාවික දිය පාරවල් හෝ ගංගා හැරවීම, ඛණිජ ද්‍රව්‍ය නැනීම, කෘෂිකාර්මික හා ජනාවාස තැනීමේ කාර්යයන් සඳහා කැලෑ එළි කිරීම වැනි කටයුතු සංවර්ධන ක්‍රියා දාමයේදී, සවභාව ධර්ම පද්ධතීන් කෙරෙහි මිනිසාගේ ගැටීම පැහැදිලි කෙරෙන නිදසුන් කීපයකි. මෙකී ගැටීම් හෙවත් අන්තර් ක්‍රියා තුළින් නිසර්ගයෙන්ම අයහපත් ප්‍රතිඵල ඇති විය යුතු නොවේ. නිදසුනක් වශයෙන්, අහිතකර ප්‍රතිඵල අඩුවෙන් හෝ රහිතව, දිය බෙත්මකට අයත් යම් කොටසක ස්වාභාවික කැලෑව සංවර්ධනය සඳහා එළි පෙහෙලි කළ හැකිවේ. එමෙන්ම අඩුවූ කැලෑ ප්‍රමාණය එයට ආසන්න වෙනත් ප්‍රදේශයක් නැවත ඇති කිරීමට ද හැකියාව තිබේ. පරිභෝජනය කරනු ලබන ප්‍රමාණය හා සමාන ප්‍රමාණයක් ප්‍රතිසම්පාදනය වීමට ඉඩ සැලසීම හෝ භාවිතයට ගන්නා ප්‍රමාණය ස්වාභාවික වර්ධනයේ සීමාවන් ඇතුලත සිදුකිරීම හෝ මගින් ස්වාභාවික සම්පත් ක්ෂයවීමක් සිදු නොවීමට වගබලා ගත හැකි වේ. ඛණිජ, ඉන්ධන වැනි අලුතෙන් ඇති නොවන සම්පත් සම්බන්ධයෙන්, ඒවා ප්‍රයෝජනයට ගැනීමේදී ගබඩා වී තිබෙන සංචිත ප්‍රමාණය අඩුවන බැවින් ක්ෂය වීමේ වේගය අඩුවන සේ පරීක්ෂාකාරීව පරිභෝජනය කළ යුතු වේ. මෙහිදී හැකිතාක් දුරට ආදේශකයන් භාවිතා කිරීමේ හැකියාව ගැන සලකා බැලීම වැදගත් වේ.

ආර්ථික සහ සමාජ සංවර්ධනය පිළිබඳ අභිමතාර්ථයන් මෑත භාගයේදී රඳා පවත්වා ගත හැකි (ධරණීය) සංවර්ධනය පිළිබඳ සංකල්පය පදනම් කරගෙන නැවත නිර්වචනය කරනු ලැබ ඇත. "ධරණීය සංවර්ධනය" යනු සංවර්ධනය පිළිබඳ තත්ත්වයක් නොව, වර්තමාන සහ අනාගත අවශ්‍යතාවන්ට මෙන්ම සම්පත් විභවතාවන්ට ගැලපෙන්නාවූ අයුරින් සංවර්ධන කටයුතු සිදු කිරීමට අදාල වන්නාවූ වෙනස් කම් ඇති කිරීම පිළිබඳ ක්‍රියාවලියක් ලෙස නිර්වචනය කෙරේ. සංවර්ධන ක්‍රියාවලිය තුළින් රටක ආර්ථිකයේ සහ සමාජයේ ප්‍රගමනශීලී පරිවර්තනයක් සිදු කෙරෙන බැවින්, ධරණීය සංවර්ධනය මට්ටමක් ඇති කර ගත යුත්තේ ආර්ථික, සමාජ, සංස්කෘතික, පාරිසරික යන අංශයන්ට අනුරූප වන සංවර්ධන ප්‍රතිපත්ති අනුගමනය කිරීම තුළින් බව අවධාරණය කළ යුතුය.

සංවර්ධනය වන රටවල් පිළිබඳව සැලකීමේදී, ධරණීය සංවර්ධනය අරමුණු ඉටු කර ගැනීම දුෂ්කර වූත් මනඃකල්පිත වූත් අභිලාෂයක් බව යමෙකුට පෙනී යා හැකිය. විශේෂයෙන් ම පරිපාලනමය,

ආයතනමය, සහ දේශපාලනමය ක්ෂේත්‍රයන්ට ආවේනික වූ හෝ ඒවා හා බැඳී පවතින විවිධ ව්‍යාකූලතාවයන් මෙම තත්ත්වය කෙරෙහි බලපාන හේතු බව දක්විය හැකිය. නිදසුනක් වශයෙන් ගතහොත්, සංවර්ධනය පිළිබඳ විශේෂ වගකීම් දරන්නාවූ අමාත්‍යාංශයන් බොහෝ විට ඔවුන්ගේ සංවර්ධන ප්‍රගමනයන් සංඛ්‍යාවන්ගෙන් හා ප්‍රමාණයන්ගෙන් නිරූපනය කෙරෙහි විශේෂ සැලකිල්ලක් යොමු කරනු පෙනේ. එමෙන්ම, සංවර්ධන කාර්යයන් හිදී පාරිසරික අවශ්‍යතා කෙරෙහි කිසිදු අවධාරණයක් යොමු නොවීමද බොහෝවිට දකිය හැකි කරුණකි. කර්මාන්ත අංශයේ වර්ධනය කෙරෙහි වගකීමක් දරන අමාත්‍යාංශය නිදසුනක් වශයෙන් ගතහොත්, ඔවුන් සිය නිශ්පාදන ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ ප්‍රමුඛත්වයක් දෙනු ලැබිය හැකි නමුත් ඊට සම්බන්ධිත පාරිසරික දූෂණ පාලනය කිරීම කෙරෙහි උනන්දුවක් නොපෙන්විය හැකිය. එම කටයුතු පාරිසරික අමාත්‍යාංශයේ වගකීමක් ලෙස සලකා අත්හැර දැමීමට පෙළඹීම බොහෝ විට දකිය හැකි තත්ත්වයකි.

මෙම ගැටළු වලට විසඳුමක් වශයෙන් සහ ධරණීය සංවර්ධනයක් සහතික කරනු පිණිස සංවර්ධන ප්‍රමුඛතා සහ උපාය මාර්ග පුනරීක්ෂණය ට ලක් කිරීම අවශ්‍යයෙන්ම සිදුවිය යුතු කාර්යයක් ලෙස සඳහන් කිරීම වැදගත් වේ. තවද, සංවර්ධන ණය, ජාත්‍යන්තර වෙළඳාම, ආර්ථික උප ව්‍යුහ සංවර්ධනය ආදී කටයුතු වලට අදාල ජාත්‍යන්තර ආධාර ප්‍රතිපත්තිවලද මෙබඳු වෙනස් කම් ඇති කල යුතු බව ද අවධාරණය කළ යුතු වේ.

සංවර්ධන සැලසුම්කරණය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුලට ස්වාභාවික සම්පත් සහ පරිසරය පිළිබඳ කරුණු හඳුන්වා දීම තුලින්, සංවර්ධන ක්‍රියාවලිය තුලින් කෙරෙන පාරිසරික හානි කාල වේලා ඇතුව හඳුනා ගැනීමට සහ ඒවා වලක්වා ගැනීමට අදාල වූ පියවරයන් ගැනීමට ඉඩකඩ සැලසෙනු ඇත.

සමස්ත සැලසුම් ක්‍රියාවලියෙන් පරිසරයට හා ස්වාභාවික සම්පත් වලට සිදු විය හැකි අහිතකර බලපෑම් තක්සේරු කිරීම, **ව්‍යාපෘති මට්ටමේදී** සිදු කෙරෙනු වෙනුවට ව්‍යාපෘතියක් සකස් කිරීමට පෙර එබඳු තක්සේරුවක් සිදු කිරීමෙන් වඩා යහපත් ප්‍රතිඵල ලබා ගත හැකි වේ. සමස්ත සැලසුම් ක්‍රියාවලිය සැලකිල්ලට ගැනීමේදී එබඳු ප්‍රවේශයකින් පහත දක්වෙන වාසිදායක තත්ත්වයන් අපේක්ෂා කළ හැකිය. ඒවා නම්,-

1. පාරිසරික වශයෙන් අහිතකර නොවන සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීමක් පරිසරය සහ ස්වාභාවික සම්පත් වඩා හොඳින් කළමනාකරණය කෙරෙනු සඳහා අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය හා වෙනත් ආර්ථික සම්පත් ප්‍රමාණවත් ලෙස වෙන් කරදීමට හැකි වීම.
2. පාරිසරික පිරිවැය සහ ප්‍රතිලාභ පිළිඹිබු වන සේ සංවර්ධන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් හා ක්‍රියාමාර්ග පිළිබඳ උචිත ඇගයුම් ක්‍රම භාවිතා කිරීම.
3. පාරිසරික දූෂණයේ දුර්විපාක අඩු කිරීම සඳහා උචිත තාක්ෂණ යොදා ගැනීම.
4. ප්‍රතිසම්පාදනීය සහ ප්‍රතිසම්පාදනීය නොවන සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම සහ ප්‍රතිසම්පාදනීය සම්පත් වැඩි දියුණු කිරීම.
5. සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම උපරිම අන්දමින් සිදු කරනු පිණිස ආදේශක සහ ප්‍රතිභාවිතා ක්‍රම යොදා ගැනීම සහ අප ද්‍රව්‍ය, අවශිෂ්ට ආදිය නැවත ප්‍රයෝජනයට ගැනීම.

## පාරිසරික බලපෑම් තක්සේරුව (Environmental Impact Assessment)

සංවර්ධන ක්‍රියාමාර්ග හෝ ව්‍යාපෘති හේතුවෙන් පරිසරයට සිදු විය හැකි අහිතකර බලපෑම් තක්සේරු කිරීම සඳහා මෙම උපක්‍රමය භාවිතා කෙරේ. මහාපරිමාන සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඒවායේ අහිතකර පාරිසරික බලපෑම් අඩු කිරීම සඳහා උචිත ක්‍රියා මාර්ග හඳුනා ගැනීම සඳහා බොහෝ රටවල පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රමය යොදා ගනු ලැබේ. නැතහොත් නිර්දේශ කරනු ලැබේ. බොහෝ ප්‍රදයක රටවල් ද, ලෝක බැංකුව වැනි වෙනත් සංවර්ධන ආයතන ද විදේශාධාර පිරිනැමීම පිළිබඳව සලකා බැලීමේදී පූර්ව අවශ්‍යතාවන් ලෙස යෝජිත සංවර්ධන ව්‍යාපෘතීන්හි පාරිසරික බලපෑම් තක්සේරුවක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවය ගැන අවධාරණය කරනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ, ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් පාරිසරික බලපෑම් තක්සේරුවක අවශ්‍යතාව 1984 තරම් කාලයක සිට පිළිගනු ලැබ ඇති නමුත්, ඵලදායී ලෙස ක්‍රියාත්මක වී නැත. වර්තමාන ආර්ථික ප්‍රතිපත්ති ද වෙනත් සංවර්ධන අභිප්‍රායයන් සහ බැඳීම් ද සැලකිල්ලට ගනිමින් පාරිසරික බලපෑම් තක්සේරුව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි දැනට සංශෝධනය කරගෙන යනු ලැබේ. පාරිසරික බලපෑම් තක්සේරු රෙගුලාසි වලින් අපේක්ෂා කෙරෙනුයේ මිනිසා සහ ඔහුගේ ජීවන වට පිටාව සංවර්ධනයේ අහිතකර බලපෑම් වලින් ආරක්ෂා කර ගැනීමයි.

මේ කාර්යයන් සඳහා පාරිසරික බලපෑම් තක්සේරු කාර්ය පටිපාටියෙහි පැහැදිලි පියවර 5 ක්

හඳුනාගෙන ඇති අතර ඒවා පහත සඳහන් අයුරින් සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.

**(අ) මූලික පාරිසරික පරීක්ෂණය Initial Environmental Examination)**

සවිස්තර ශක්‍යතා වාර්තාවක් පිළියෙල කිරීමට පෙර, යෝජිත සංවර්ධක ව්‍යාපෘතියක පාරිසරික බලපෑම් පරීක්ෂා කිරීමට මෙහිදී ඉඩකඩ ලැබේ. ලබාගත හැකිව තිබෙන දත්ත සහ තොරතුරු ප්‍රයෝජනයට ගැනීමෙන් ද මහජනයා සහ උනන්දුවක් දක්වන වෙනත් ආයතන සමග සාකච්ඡා කිරීමෙන් ද යෝජිත සංවර්ධනයෙන් ඇතිවිය හැකි බලපෑම් තක්සේරු කළ හැකි ය.

හඳුනා ගනු ලැබූ යම් ප්‍රශ්නයක් තවදුරටත් අධ්‍යයනය කිරීම අවශ්‍ය ද නැද්ද යනු නිගමනය කිරීම සඳහා මූලික පාරිසරික පරීක්ෂණයේදී සොයා ගන්නා ලද කරුණු ප්‍රයෝජනයට ගනු ලබනවා ඇත.

**(ආ) ක්ෂේත්‍ර නිරීක්ෂණ (Scoping)**

ක්ෂේත්‍ර නිරීක්ෂණයේ පරමාර්ථය වනුයේ, යෝජිත සංවර්ධනයේ ප්‍රතිඵල වශයෙන් මතුවිය හැකි පාරිසරික ගැටළු පිළිබඳ අදහස් ද ඒවාට විසඳුම් ද ඉදිරිපත් කිරීම සඳහා බලපෑමට ලක් වූ හෝ උනන්දුවක් දක්වන හෝ අයට ඒ සඳහා අවස්ථාව සලසා දීමයි.



**(ඇ) පාරිසරික තක්සේරුව (Environmental Assessment)**

ක්ෂේත්‍ර නිරීක්ෂණ අවස්ථාවෙහි දී හඳුනා ගනු ලබන ප්‍රශ්න සහ බලපෑම් කෙරෙහි අවධානය යොමු කරමින් සවිස්තර පාරිසරික බලපෑම් තක්සේරුවක් පිළියෙල කිරීමට අවස්ථාව ලැබේ. සංවර්ධනයට ඉලක්ක වන ප්‍රදේශයේ පවත්නා තත්ත්වය, දුර්විපාක අඩු කිරීම සඳහා නිර්දේශ කරනු ලබන ක්‍රියා මාර්ග, සංරක්ෂණය උපායමාර්ග ආදී කරුණු සැලකිල්ලට ගනිමින් පාරිසරික තක්සේරු වාර්තාව පිළියෙල කළ යුතු වේ. එම වාර්තාව මහජනතාවට යොමු කිරීමෙන් ඔවුන්ගේ එකඟතාවය ලබා ගැනීමෙන් පසුව අවසාන වාර්තාව පිළියෙල කිරීම සම්පූර්ණ කළ යුතුයි.

**(ඈ) පාරිසරික ප්‍රශ්න විසඳීමේ කාර්ය සැලැස්ම (Environmental Action Plan)**

නිර්දිෂ්ට පාරිසරික ක්‍රියාවන්හි ශක්‍යතාව හා ප්‍රායෝගිකතාවය මේ අවධියෙහි දී විමසා බලනු ලැබේ. ක්‍රියා මාර්ගයේ ස්වරූපය, ක්‍රියාත්මක කරන ආයතන, අධීක්ෂණ වගකීම, ක්‍රියාත්මක කරන ආකාරය, කාල නියමයන්, මුදල් යෙදවීම සහ තාක්ෂණික අවශ්‍යතා ආදී විස්තර ඇතුලත් කාර්ය සැලැස්මක් සම්පාදනය කිරීම මෙහිදී සිදු කෙරේ.


**(ඉ) පරිපූරක පාරිසරික වාර්තාව (Supplemental Environmental Report)**

පාරිසරික බලපෑම් තක්සේරුවේ ප්‍රතිඵලයක් වශයෙන් යම් අපගමනයක් හෝ වෙනස් කිරීමක් හෝ සැලකිල්ලට ගනිමින් පරිපූරක පාරිසරික වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘති යෝජකට/සංවර්ධකට අවස්ථාවක් දෙනු ලැබේ.

ධරණීය සංවර්ධනය පිළිබඳ ඉලක්කය කරා ළඟා වීම සඳහා උපයෝගී කරගත හැකි මාධ්‍යයක් වශයෙන් පාරිසරික බලපෑම් ක්‍රියා මාර්ගයේ ප්‍රමාණවත් බව ප්‍රශ්නයට තුඩු දෙන්නකි. සැලසුම් සම්පාදනයේ හා තීරණ ගැනීමේ උපකරණයක් වශයෙන් එහි ඵලදායී බව වෙනත් සාධක රාශියක් මත රඳා පවතින බව පෙනේ. ඒවා අතරින් බෙහෙවින් ම තීරනාත්මක ඒවා නම් රජයේ ආයතනික ශක්තිය, ජනතාවගේ ක්‍රියා කාරී සහභාගීත්වය සහ සංවර්ධකයාගේ නම්‍යතාවය සහ උපයෝගී කර ගන්නා ශිල්පීය ක්‍රමයේ යෝග්‍යතාවය ද වේ.

ආයතනික අරමුණු සහ අභිප්‍රායන්, වෘත්තීය පක්ෂපාතිකම් වැනි කරුණු සඳහන් කළ හැකිය. එමෙන්ම ප්‍රකාශිත දේශපාලනමය හෝ ආර්ථික අභිප්‍රායයන් විසින් සංවර්ධනයෙන් සිදුවිය හැකි අහිතකර බලපෑම් සැලකිල්ලට නොගැනීමක් හෝ යටත් වීමක් කෙරෙන අවස්ථා ද තිබිය හැකිය. මේ තත්ත්වයන් යටතේ පාරිසරික බලපෑම් තක්සේරුව තුලින් හුදෙක් යෝජිත සංවර්ධන ව්‍යාපෘතියට පාරිසරික බලපෑම් සම්බන්ධයෙන් පාර්ශවීය හෝ මතුපිටින් දැකිය හැකි තක්සේරුවක් පමණක් ලබා දීමට බොහෝ ඉඩ කඩ ඇත.

තුන්වැනි කරුණ වශයෙන් දැක්විය හැක්කේ පාරිසරික බලපෑම් ත්කසේරු රෙගුලාසි ඵලදායී අන්දමින් ක්‍රියාවේ යෙදවීමේ සැකසහිත භාවයයි. නීති හා රෙගුලාසි ක්‍රියාවේ යෙදවීම සඳහා ප්‍රමාණවත් පුහුණුවක් ලැබුණු විශාල කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වේ. එමෙන්ම ඒ සඳහා දිරි ගැන්වීමේ උපාය මාර්ග සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පරිපාලනමය හා කළමනාකරණය හැකියාවන් මෙන්ම මූල්‍ය සම්පත් ද අවශ්‍ය වේ.



සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් එකලාව සිදු කරනු ලබන පාරිසරික බලපෑම් තක්සේරුව අදාල ගැටළු පැහැදිලි කර හඳුනා ගැනීමට හෝ උචිත විසඳුම් සොයා ගැනීමට ප්‍රමාණවත් වන්නාවූ ක්‍රමයක් නොවන බව නිරීක්ෂණය කරනු ලැබ ඇත. දෙවැනිව, පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියා වලිය නිසි පරිදි සිදු නොවීම පිණිස විවිධ බාධක පැමිනීමේ හැකියාවයි. ඒ අතරින් බෙහෙවින් ම වැදගත් ප්‍රමාණවත් දත්ත සහ තොරතුරු නොතිබීම,

හතර වැනි ව පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියා පටිපාටියක් තුලින් වඩා හොඳ පාරිසරික කළමනාකරණයක් ඉටු කිරීම සඳහා උචිත තාක්ෂණයක් සඳහා ඒවා ලබා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් රටක් සතුව තිබීම ද ඉතා වැදගත් පරිපූරක අවශ්‍යතාවයක් ලෙස සඳහන් කළ යුතුය.

## උපාය මාර්ගික පාරිසරික තක්සේරුව

ව්‍යාපෘති පදනම් කොටගත් පාරිසරික බලපෑම් තක්සේරුවේ අඩු ලුහුඬු කම් කෙරෙහි සැලකිල්ල යොමු කරමින් විකල්ප ප්‍රවේශයන් ගැන සොයා බැලීම කෙරෙහි ලෝක සංවිධානයන් හි අවධානය යොමු වී තිබේ. උපාය මාර්ගික පාරිසරික තක්සේරුව එවැන්නක් වන අතර එමගින්, සංවර්ධනයේ පාරිසරික බලපෑම් පිළිබඳව සැලසුම් සම්පාදනයේ මුල් අවස්ථාවේදීම එනම් ප්‍රතිපත්ති සකස් කිරීමේදීම සලකා බැලීමට ඉඩ ලැබෙනු ඇත. සමස්ථ සැලසුම් කරන ක්‍රියාවලියම අයත් වනසේ පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියාවලියේ විෂය පථය පුළුල් කිරීමේ අවශ්‍යතාවය ලෝක බැංකුව මගින් ද අවධාරණය කර තිබේ. මෙම නව ප්‍රවේශය මගින්, ප්‍රතිපත්තිමය අඩුලුහුඬු කම් හේතුවෙන් මතුවිය හැකි අහිතකර පාරිසරික බලපෑම් පිළිබඳව පරීක්ෂා කාරීව විමසා බැලිමට තීරණ ගන්නන් හට අවස්ථාව සලසා දෙනු ලැබේ. තවද, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ඇගයීමේ කාර්යයේ නියැලෙන සැලසුම් සම්පාදකයන් හට ආංශයීය සංවර්ධනයෙහි පාරිසරික බලපෑම් හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම, සහ මැදිහත් වීම් වශයෙන් උචිත ප්‍රතිපත්ති සම්පාදනය හෝ අනුගමනය කෙරෙන්නාවූ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම වැනි ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට උපාය මාර්ගික පාරිසරික තක්සේරුවෙන් අවස්ථාව සැලසේ.

විවෘත වෙළඳ ආර්ථිකයක් තුළ සංවර්ධන ව්‍යාපෘති තෝරා ගැනීමේදී යොදා ගැනෙන ප්‍රධාන උපමානයක් වන්නේ ආයෝජනයන්හි මූල්‍ය ස්ථායීතාවයයි. ව්‍යාපෘති විශ්ලේශණ යේදී මෙය මනිනු ලබන්නේ ආයෝජනයේ හා ප්‍රතිලාභයේ අව ප්‍රමාණ වටිනාකම් මත ය. ආයෝජනයේ ආර්ථික ප්‍රතිලාභය කෙරෙහි ඇති කෙරෙන මෙකී දැඩි අවධාරණය හේතුවෙන් අනිකුත් වැදගත් අංශ එනම්, පාරිසරික හෝ ස්වාභාවික සම්පත් හෝ සංස්කෘතිකමය අංශ හෝ කෙරෙහි ඇති කෙරෙන අහිතකර බලපෑම් පිළිබඳ අව තක්සේරුවක් හෝ බොහෝ විට කිසිදු තක්සේරුවක් සිදු නොවීමට බොහෝ ඉඩ කඩ තිබෙනු පෙනේ. සැලසුම් සම්පාදනයේ මුල් අවස්ථාවේදීම සමස්ථ සැලසුම් ක්‍රියා වලිය තුලට පාරිසරික කරුණු ඇතුලත් කිරීමෙන් මෙබඳු අඩුපාඩු කම් මග හරවා ගත හැකි වේ.

තවද, ආර්ථිකයේ අංශයීය සංවර්ධන අරමුණු ඒකාබද්ධ කෙරෙන අයුරින් සංවර්ධනයේ බලපෑම් තක්සේරු කිරීමට උපාය මාර්ගික තක්සේරුවෙන් අවස්ථාව සැලසේ. එකිනෙකට පරස්පරවන අරමුණු දකින්නට ලැබෙන අවස්ථාවන් හිදී විකල්ප උපාය මාර්ග හෝ මැදිහත් වීම් ඉදිරිපත් කිරීමට ද උපාය මාර්ගික තක්සේරු ක්‍රමයෙන් සැලසුම් සම්පාදකයින්ට අවසර ලැබෙනු ඇත.

ධරණීය සංවර්ධන අරමුණ කරා ලඟා වීම සඳහා රටවල් හතේ කණ්ඩායම තවත් පියවරක් ඉදිරියට තබමින් තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී පාරිසරික කරුණු කෙරෙහි නිසි අවධානය යොමු කිරීමට පෙළඹී ඇත. මක්නිසාද යත්, මෙවැනි පියවරක් මගින් සැලසුම් සම්පාදකයගේ කාර්ය භාරය වඩා විවෘතව සහ වඩා ඵලදායීව ඉටු කිරීම සඳහා හිතකර වාතාවරණයක් සැලසෙන බැවිනි. ඒ අනුව මෙබඳු ප්‍රවේශයකින් පහත සඳහන් වාසිදායක ප්‍රතිඵල ලැබෙනු ඇත.

1. පාරිසරික අරමුණු, ආර්ථික අරමුණු සමඟ ඒකාබද්ධ කිරීමට තීරණ ගන්නන් කෙරෙහි බලපෑමක් ඇති කිරීම. නිදසුනක් වශයෙන් - ආර්ථික ප්‍රතිලාභ, වෙළඳ පොල අවස්ථාවන් වැනි අරමුණු වලට හා සමාන අවධාරණයක් පාරිසරික අරමුණු කෙරෙහි ද දැක්වීමට තීරණ ගන්නන් හට අවස්ථාව සැලසේ.
2. සංවර්ධනයෙන් පරිසරයට ඇතිවන අහිතකර බලපෑම් කෙරෙහි සැලසුම් සම්පාදකයන් සහ තීරණ ගන්නන්ගේ අවධානය යොමු කිරීම සහ අනුකූල ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සඳහා ඔවුන් උනන්දු කිරීම.
3. දීර්ඝ කාලීන වශයෙන් අහිතකර වූ පාරිසරික පල විපාක සහිත සංවර්ධන ව්‍යාපෘති වෙනුවට විකල්ප සංවර්ධන ක්‍රම සලකා බැලීමට ඉඩ ලැබීම.
4. පාරිසරික ප්‍රශ්න වලට දීර්ඝ කාලීන විසඳුම ලබා ගැනීම ඉලක්ක කර ගත් මූලික ප්‍රතිපත්ති වල වෙනස් කම් සිදු කිරීම පිළිබඳ සලකා බැලීම. නිදසුනක් වශයෙන්, අහිතකර පාරිසරික බලපෑම් තුරන් කිරීම හෝ අඩු කිරීම සඳහා රීතිමය ක්‍රියා මාර්ග, දිරි ගැන්වීම් ආදිය තුලින් උචිත මැදිහත් වීම් යෝජනා කිරීමට ඉඩ ලැබේ.

පරිසරය සුරැකීමත්, ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීමත් සඳහා සංවර්ධිත රටවල් විවිධ ක්‍රියා මාර්ග යොදා ගනු ලබන බව පෙනේ. වර්ෂ 1988 දී සිදු කරනු ලැබූ අධ්‍යයනයකට අනුව මෙබඳු ක්‍රියා මාර්ග 153 ක් අතරින් 91 ක් බදු, වරිපනම් ආදියටත්, 41 ක් සහනාධාර වලටත්, 31 ක් වෙළඳ පල මැදිහත් වීම් වලටත් අදාල වූ බව පෙනී ගොස් ඇත. ධරණීය සංවර්ධනයක් ඇති කර ගැනීම සඳහා උචිත මැදිහත් වීම් තීරණය කිරීමෙහිලා උපාය මාර්ගික පාරිසරික තක්සේරුව බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නේ ඉහත කී මැදිහත් වීම් පිළිබඳව විශේෂ සැලකිල්ල යොමු කළ හැකිවන බැවිනි.

ශ්‍රී ලංකාවෙහි විවෘත ආර්ථික රාමුව තුල බලාපොරොත්තුවන ආර්ථික සංවර්ධනයත් සමඟ යහපත් ජීවන වට පිටාවක් ගොඩ නැගීම සහතික

කිරීම සැලසුම් සම්පාදකයන් හා තීරණ ගන්නන්හට පැවරෙන වැඩි වගකීමක් වේ. සැලසුම් සම්පාදන ක්‍රියාවලිය විමධ්‍ය ගත කිරීම තුලින්, පෙර කී පරිදි ආර්ථික සංවර්ධනය සමග යහපත් ජීවන වට පිටාවක් ඇති කිරීමේ හැකියාවක් වඩාත් ප්‍රායෝගික බවට පත්වනු නොඅනුමානය. ධරණී සංවර්ධනයක් ගැන සහතික විය හැක්කේ පාරිසරික අවිරෝධතාවයකින් යුතුව ආර්ථික හා පාරිසරික සම්පත් ප්‍රයෝජනයට ගනු ලබන වාතාවරණයක් ඇති කිරීමට සංවර්ධන සැලසුම් සම්පාදකයන් සමත් වෙතොත් පමණි.